මව්රට දැණ් ඉරිදා
2026 ජුනි 14

# හාට්

හදවත් හිරව්ට්ටන් තැන... HEART



Lochana Jayakodi

Click by **Charuka Perera**



# කැපිලි කෙටිලි ඉරිසියාව මම ළඟ නැහැ...

# උදේනි පට්ට ඇණයක්?

උදේනි නදීකා පීරිස්

**අපි කවුරුත් කැමැති, කාටවත් ඇණයක් නොවී පාඩුවේ ඉන්නයි. හැබැයි ඇණයක් වෙන අය කොයි වගේද කියන්න දන්නවනේ. එහෙම ඇණයකට කොටුවුණු ජනප්‍රිය රංගන ශිල්පිනියක වන උදේනි නදීකා පීරිස්ගේ දස්කම් ගැනයි 'හාට්' අපේ මේ කතාබහ.**

**උදේනි ඇණයක්ද ඇත්තටම?**

කවුද අනේ එහෙම කියන්නේ? මම පාඩුවේ හැමෝම සමග සුහදව ඉන්න කෙනෙක්. හැබැයි ගැහුවොත් ඔළුව පාත් කරන කෙනෙක් නම් නෙවෙයි. මම කිසිම කෙනකුට ඇණයක් වෙන්න කැමැති නැහැ. මම ගැන ඕනෑ තරම් විවේචන ඇති. මට මොන දේ කිව්වත් මම සියලු දෙනා සමග සුහදව කටයුතු කරනවා. මට එහෙම එක දිගට නිර්මාණවලට සම්බන්ධ වෙන්න වුවමනාවක් නැහැ.

මට කිසිම කෙනෙක් කපාගෙන ඉදිරියට යන්න අදහසක් නැහැ. මම ළඟ ඉරිසියාවක් නැහැ. මේ ක්ෂේත්‍රයේ සදාකල් රැඳිලා ඉන්න අපි කාටවත් බැහැ. මගේ දක්ෂතාව උපරිම ඉදිරිපත් කරලා ප්‍රේක්ෂකයන්ට මතකයක් ඉතුරු කරමින් සතුටින් දවසක සමුග න්නවා.

**එතකොට උදේනි කාටද මේ ඇණයක් වෙන්න යන්නේ?**

තවම මම ඇණයක් වුණේ නැහැ. සමහර විට ලේලිට ඇණයක් වෙයිද දන්නේ නැහැ. මගේ පුතාට රඟපාන්නේ රොෂාන් පිලපිටිය. ලේලිය පියුමි බොතේජු. එකතු වෙන්න 'බෝල්ට් ඇණය' සමග. ලොකු වෙනසක් දැනෙයි මේ ටෙලිනාට්‍යය නරඹනකොට. 'බෝල්ට් ඇණයක්' ටෙලිනාට්‍යයේ මම රඟපාන්නේ 'සුනීතා' කියන චරිතය. රෙදි මහන, ධෛර්යවන්ත මවකගේ චරිතයක් තමයි මම රඟපාන්නේ.

**මේ කාලවකවානුවේ ඔබේ රංගන ස්වභාවයේ වෙනසක් අපි දකිනවා?**

ඔව්. මුල්ම කාලේ නම් එකම චරිතවලට තමයි මට කතා කළේ. 'පබා' ටෙලිනාට්‍යයේ රඟපාන කාලේ 'මාර්තා' චරිතයට ප්‍රේක්ෂක ප්‍රතිචාර හොඳට ලැබුණා. හොඳ නිර්මාණයක චරිතයක් හොඳට කළොත් කොටුවීමක් වෙනවා. හැබැයි හැම හැම චරිතයක්ම මම උපරිම කරනවා. 'රන්තිලි වැව' ටෙලිනාට්‍යයේ මැණිකේ චරිතය මම රඟපෑවා. මැණිකේ චරිතය හරහා මම නිර්මාණ කිහිපයකට සම්බන්ධ වුණා. මැණිකේ චරිතය සඳහා මට ආරාධනා එන්නේ මගේ රූප ස්වභාවය සමග ඔසරිය ඇන්දම එන පෙනුම නිසා. මේ කාලේ නම් වෙනස් චරිත රඟපෑමට මට අවස්ථාව ලැබුණා. රංගන ශිල්පිනියක් වශයෙන් අපි කවුරුත් කැමැතියි වෙනසක් කරන්න. අඩු තරේම ඇඳුමෙන් පැලඳුමෙන් හරි වෙනසක් වෙනකොට චරිතය වුණත් වෙනස්ම හැඩයක් ගන්නවා. එහෙම වෙනසක් වෙනකොට චරිත වුණත් රඟපෑමට ලොකු ආශාවක් එනවා අලුත් රංග ස්වභාවයන් එකතු කරමින්.

**ඒ වෙනස ළඟදිම අපට දැකගන්න ලැබේවි?**

මේ මගේ හොඳම කාලයක් රංගනය පැත්තෙන්. පසුගිය දවස්වල ජී. නන්දසේනගේ 'කිනිසි වත්ත' ටෙලිනාට්‍යයේ වෙනස්ම චරිතයක් රඟපෑවා. එය පාතාල කතාවක්. මගේ සැමියා ලෙස රඟපාන්නේ ආනන්ද අතුකෝරල. මට හිතෙනවා ප්‍රේක්ෂකයන් මගේ ඒ චරිතය හරහා ලොකු වෙනසක් දකීවි කියලා. එකම විදියේ චරිත රඟපානකොට අපිට වුණත් යම් එපාවීමක් දැනෙනවා.



'රන්තිලි වැව' ටෙලිනාට්‍යයේ මැණිකේ චරිතය මම රඟපෑවා.

**ඔය අතරේ උදේනි විලංගුවකුත් දැම්මා?**

'විලංගුව' ගැන කතාකළ යුතුමයි. මට වුවමනා කළා කාලෙක ඉඳලා කාලීන මාතෘකාවක් මූලික කරගෙන නිර්මාණයක් කරන්න. සැමියන්ගේ මත්පැන් පානය නිසා ගැහැනියකට අත්වන ඉරණම මූලික කරගෙන තමයි මම මේ නිර්මාණය කරන්නේ. රටේ වෙසෙන සියලු කාන්තාවන් නැරඹිය යුතු ටෙලිනාට්‍යයක් විදියට 'විලංගු' හඳුන්වා දෙන්න කැමැතියි. මම මීට පෙර 'හීන හොයන විසේකාරියෝ' වේදිකා නාට්‍යය ජනගත කළා. මේ නාට්‍ය දෙකම මගේ රචනයක්. 'විලංගු' වේදිකා නාට්‍යය තව මාස කිහිපයකින් දැකගන්න පුළුවන්. එය සමාජයට හොඳ ආදර්ශයක් දෙන නිර්මාණයක් වේවි.

**ප්‍රේක්ෂකයන්ට වේදිකාව රසවිඳින්න අපහසු කාලයක් නේද මේ කාලවකවානුව?**

ඇත්තටම එහෙම ප්‍රශ්නයක් තියෙනවා. රටේ ආර්ථික ප්‍රශ්න තියෙනවා. ප්‍රේක්ෂක ජනතාව ප්‍රශ්න ගොඩක ඉන්නේ. ඒත් වේදිකාවට ආදරය කරන පිරිසකුත් ඉන්නවා. මම පටන්ගත්ත වැඩේ කරන්න තමයි සැලසුම. මේ දිනවල ඒ වැඩකටයුතු සූදානම් කරමින් යනවා. විලංගු ඔබ ආදරය කරන තවත් නිර්මාණයක් වේවි.

**අවුරුදු ගානක් රැකගත්ත නිර්මාණය වෙනුවෙන් කොහොමද සූදානම?**

ඒක මම ලියපු ටෙලිනාට්‍ය පිටපතක්. මම එය රචනා කරලා අවුරුදු පහක් විතර වෙනවා. තවම ඒ වැඩකටයුතු වෙනුවෙන් සැලසුමක් කරගන්න බැරි වුණා. මොකද රූපවාහිනී නාලිකාවල තියෙන ප්‍රශ්න සමග ලොකු මුදලක් යටකරන්න අපහසු නිසා. එහෙම හිතලා ටෙලිනාට්‍ය විකාශය කරගන්න බැරි වුණොත් ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවෙනවා. ඒ වගේම ක්ෂේත්‍රයේ අවුරුදු ගානක් වැඩකරලා නිකන් කලකිරීමක් ඇතිවෙයි. හරි ස්ථාවරයකට නාලිකාවකින් අවස්ථාව ලැබුණොත් ඒ වැඩකටයුතු ලස්සනට නිර්මාණය වෙයි. මම රඟපාපු ටෙලිනාට්‍ය දහයක් විතර තියෙනවා විකාශය කරගන්න බැරිව නිෂ්පාදකවරුන් අසරණ වෙලා.

**කාලෙක ඉඳලා දැකපු සිහිනයක් ඔබේ සිනමාවේ දකිනවා?**

'වෙස්සන්තර' චිත්‍රපටයේ මගේ චරිතය වෙස්සන්තරගේ මව. අවුරුදු පහක් විතර වෙනවා මම ඒ චිත්‍රපටයට සම්බන්ධ වෙලා. මේ දිනවල සිනමා ශාලා කිහිපයකම තිරගත වෙනවා. ආගම දහම අපේ සංස්කෘතිය ගැන ඉස්මතු වෙන විශිෂ්ට නිර්මාණයක් විදියට වෙස්සන්තර චිත්‍රපටය හඳුන්වන්න පුළුවන්. කාලයක් ගෙවිලා හරි තිරගත වීම ගැන



මගේ පුතාට රඟපාන්නේ රොෂාන් පිලපිටිය. ලේලිය පියුමි බොතේජු.

# ගැහුවොත් ඔළුව පාත් කරන්නේ නැහැ...



මම සතුටු වෙනවා. පාසල් දරුවන්ට අධ්‍යාපනය පැත්තෙන් නැරඹිය යුතුම චිත්‍රපටයක්. මොකද අපි කවුරුත් දන්න කතාවක් වෙස්සන්තර ජාතකය.

**ඔබ රංගනයට වගේම ව්‍යාපාර පැත්තටත් නැඹුරුව වැඩ කරන කෙනෙක්?**

රංගන ශිල්පිනියක් වෙලා මදි කියලා හිතලා තමයි මම මගේම දෙයක් කරන්න හිතුවේ. 2004 වර්ෂයේ තමයි මම ව්‍යාපාර පැත්තට යොමුවුණේ. විවිධ ව්‍යාපාර කළා මම. පස්සේ මම බතික් පිළිබඳ හැදෑරුවා. බතික් කියන්නේ කලාවක්. මමත් කලාකාරිනියක් නිසා ගහට පොත්ත වගේ එකට ගැළපුණා. ලිලිනා ක්ලෝතින් නමින් මගේ බතික් ව්‍යාපාරය මහරගම මේ වනවිට කරගෙන යනවා. ක්ෂේත්‍රයේ හිතවත් සියලු දෙනාගෙන් ඊට ලොකු සහායක් ලැබෙනවා.

**වසන්ත විතාරණගේ**

**කලාව කියන්නේ තරගයක් නම්, ඒ තරග බිමේ නොබියව සටන් වදින අපූරු නිර්මාණකරුවෙකි ඔහු. සිනහව මැදින් 'ඔෆිස්ලන්තේ' කැඳවාගෙන ආ ලසිත කාරියවසම්, සිය කුලුඳුල් ප්‍රාසාංගික සිහිනය වූ 'ගේට්ටුවා' ප්‍රේක්ෂකයා අබියසට රැගෙන එන්නේ වසර හතක දීර්ඝ නිහඬ සටනකින් පසුවය. නාලිකාවලින් හැලෙද්දීත්, විකාශන කාලවේලාවන් අහිමි වෙද්දීත් තම නිර්මාණය කෙරෙහි වූ විශ්වාසය අත්නොහළ ඔහු, අද ජාතික තිරය මතින් සිය ජයග්‍රහණය සනිටුහන් කර හමාරය. සිය කුලුඳුල් දරුවාගේ සුරතල් බලමින් ජීවිතයේ සුන්දරම කාලය ගෙවන මේ දක්ෂ අධ්‍යක්ෂවරයා, වසර හතක කටුක ගමනේ ඇතුළාන්තය මෙසේ 'හාට්' පිටු අතරින් දිගහරියි.**

# මම කරපු එක වැඩක්වත් ෆේල් නැහැ...

## ලසිත කාරියවසම්

**වැඩ ඇතුළේ අපි ගහගන්නවා...**

**ඊත් තරහක් නැහැ...**

**ලසිත මේ දිනවල ගොඩක් සතුටින් කියලා අපි හිතනවා?**

ඇත්තටම ඔව්. මම ගොඩක් සතුටින්. මගේ කුලුඳුල් දරුවාගේ හැඩ බලමින් ඒ වෙනුවෙන් කාලය ගතකරමින් ඉන්න කාලයක් තමයි මේ.

**'ගේට්ටුවා' ටෙලිනාට්‍යයේ ආරම්භයට සෑහෙන කාලයක් ගෙවීගිය බව ආරංචියි?**

කාලෙක ඉඳලා මම දැකපු සිහිනයක්. මම හිතුවා ප්‍රාසාංගික හොඳ නිර්මාණයක් කරන්න ඕනේ කියලා. මගේ කුලුඳුල් නිර්මාණය 'ගේට්ටුවා' 2019 වර්ෂයේ කොරෝනා වසංගතය අවසාන කාලයේ රූගත කිරීම් ආරම්භ කළේ. ඉතින් කොහොම හරි මට අවුරුදු හතක් විතර ගියා ටෙලිනාට්‍යය ප්‍රේක්ෂකයන්ට රසවිඳින්න ඉඩ ලබාදීමට. 'ගේට්ටුවා' සතියේ දිනවල රාත්‍රී 8.30ට ජාතික රූපවාහිනියෙන් විකාශය වනවා. හැබැයි කාලයක් ගෙවිලා ගියත් ප්‍රේක්ෂකයන් ආදරයෙන් මේ නිර්මාණය වැලඳගෙන තිබෙන එක ගැන මම සතුටු වෙනවා.

**මෙපමණ කාලයක් ගතවීමට හේතුව?**

හේතුව මොකක්ද කියන්න මම දන්නේ නැහැ. රූපවාහිනී නාලිකා කිහිපයකටම මම මේ නිර්මාණය භාරදුන්නා. ඒ හැම නාලිකාවකින්ම 'ගේට්ටුවා' සමත් වුණා. හැබැයි එහෙම වුණාට විකාශය කිරීමට බෙල්ට් එකක් ලැබුණේ නැහැ. ඉතින් මම දෙවැනි වතාවටත් නැවත ජාතික රූපවාහිනියට නිර්මාණය භාරදුන්නා. කියන්න සතුටුයි නව අධ්‍යක්ෂ මණ්ඩලය නිර්මාණය භාර අරගෙන කාලවේලාවකුත් ලබාදීපු එකට මම රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියලු දෙනාට ස්තූතිය පුදකරනවා. මම හිතනවා 'ගේට්ටුවා' නාට්‍යයට සුදුසුම කාලය දැන් කියලා. මගේ විතරක් නෙවෙයි නිර්මාණයේ සියලු දෙනාගේ උත්සාහය මහන්සිය අපගේ ගියේ නැහැ.

**වසර 7ක පමණ කාලයක් ගෙවීයෑමත් සමග කතාවට වුණත් ලොකු වෙනසක් දැනෙනවා ඇති?**

මේ කතාව පොඩි ළමයෙක්ගේ අධ්‍යාපන සිහිනය ගැන කියැවෙන කතාවක්. තවත් සමාජ පසුබිම් ප්‍රශ්න කිහිපයක් මූලික කරගෙන මෙය ගලාගෙන යනවා. නීතිමය ප්‍රශ්නයක් ගැන. ලියාපදිංචිය තහවුරු කරගැනීමට නොහැකිව දරුවෙක් පාසලට ඇතුළත් කිරීමට නොහැකිව ඇතැම් අය අදටත් සමාජයේ මේ වගේ ප්‍රශ්නවලට මුහුණ දෙනවා. 'ගේට්ටුවා' පිටපතේ තිබුණු විදියට ළමයා අවසානයේ පරිවාසයට යනවා. ඒ තිබුණු පෙළගැස්මත් එක්ක කතාව පැත්තෙන් බැලුවොත් කාලය ගෙවුණත් ලොකු වෙනසක් නිර්මාණයට බලපෑමක් වුණේ නැහැ. වෙනසකට තිබුණේ ඒ දරුවා කාලය ගෙවීයෑමත් සමග උස්මහත් වෙලා. හැබැයි ටෙලිනාට්‍යයේ භාගයක්ම අපි රූගත කිරීම් අවසන් කරලා තිබුණේ. කතාවේ හැටියට ළමයා පරිවාසයට යන නිසා නැවත ඒ දරුවාගේ වෙනස්වීමත් එක්ක ප්‍රශ්නයක් නොවුණු එකට සතුටුයි. හැබැයි එහෙම වෙනස් නොවීමත් කතාවේ නොතිබුණා නම් ලොකු බලපෑමක් සිදුවෙන්න තිබුණා.

> **වෙනසකට තිබුණේ ඒ දරුවා කාලය ගෙවීයෑමත් සමග උස්මහත් වෙලා.**

**චරිත නිරූපණය කරන ශිල්පීන් තුළ ලොකු වෙනසක් දකිනවා?**

ඒ වෙනස දනවන්න තමයි මටත් වුවමනා වුණේ. මේ නිර්මාණය වෙනුවෙන් චරිත තෝරාගැනීමේදී මම කිසිම ලස්සන රූප ස්වභාවයක් බැලුවේ නැහැ. ගම්වල ජීවත්වෙන ජීවිත මුහුණු, දුක් විඳින රූපරාමුවකට ගේන්න තමයි මම උත්සාහ කළේ.

**ඔබේ මේ ජයග්‍රහණයට ලැබෙන ප්‍රතිචාර කොහොමද?**

ලංකාවේ ප්‍රේක්ෂක කණ්ඩායම් දෙගොල්ලක් ඉන්නවා. මම 'ගේට්ටුවා' ටෙලිනාට්‍යයට පසු සින්ඩු, තත්පර 60, ඔෆිස්ලන්තේ නිර්මාණ අධ්‍යක්ෂණය කළා. මුලින්ම විකාශය වුණේ ඔෆිස්ලන්තේ. එය හාස්‍යයට බර නිර්මාණයක්. එකිනෙකට වෙනස් රසවින්දන සහිත ප්‍රේක්ෂකයන් ඉන්නවා. මම කරපු කිසිම නිර්මාණයක් ෆේල් වුණේ නැහැ. හැබැයි මම හිතනවා මගේ ජයග්‍රහණය 'ගේට්ටුවා' කියලා.

**දැවැන්ත දෙපළක් සමග ලබපු ජයග්‍රහණය කොහොමද?**

මම මේ වනවිට ඒකාංගික ටෙලිනාට්‍ය 35කට වැඩි ප්‍රමාණයක් කරලා තියෙනවා. 2018 රාජ්‍ය සම්මාන උළෙලේ මගේ 'ශෝධක' ඒකාංගික ටෙලිනාට්‍යයටත්, 2019 සුමති සම්මාන උළෙලේදී මගේ 'අවලෝකන' ඒකාංගික ටෙලිනාට්‍යයටත් සම්මාන ලැබුණා. ඒ වගේම දැවැන්ත පිරිසක් එකතු වෙලා හදපු පිට්ටනියේ තමයි අපි බෝල ගහන්නේ.

**මේ නිර්මාණ තරගකාරීත්වයට ඔබේ සූදානම කොහොමද?**

මමත් තරගයට සූදානම්. නිර්මාණය ඇතුළේ අපි සටන් කරනවා. වැඩ ඇතුළේ ගහගන්නවා. කෙනකු සමග පෞද්ගලික තරහක් නැහැ. මේ තරගකාරී නිර්මාණ කලාවට මම මුහුණ දෙනවා. ඇත්තටම දක්ෂයෙක් නම් මේ වෙලාවේ ඔහුට ජයගන්න පුළුවන්.

**වසන්ත විතාරණගේ**

# මගේ හීනය අතහැරියේ නැහැ...



# කාමර අංක 106 රිදී තිරයට...

**කලකට පෙර මෙරට මහත් ආන්දෝලනාත්මක සිදුවීමක් ලෙස සැලකුණු කොළඹ වේල්ල වීදියේ ජනාකීර්ණ ප්‍රදේශයක අතහැර දමාගෙ ාස් තිබූ ගමන් බෑගයක තිබියදී හමුවූ හිසක් නොමැති මළ සිරුර පිළිබඳ ප්‍රවෘත්තිය තවමත් ජනතාවගේ මතකයේ රැඳී ඇතුවාට සැක නැත.**



එම සත්‍ය සිදුවීම පාදක කරගනිමින් ප්‍රවීණ නිර්මාණවේදී සුරංග ද අල්විස් විසින් නිර්මාණය කරන ලද 'කාමර අංක 106' චිත්‍රපටය එළැඹෙන ජූනි 26 වැනි දින සිට තිරගත වීමට නියමිතව ඇත.

මෙහි බිමල් ජයකොඩි, ශ්‍යාම් ප්‍රනාන්දු, ධනංජය සිරිවර්ධන, දමිතා අබේරත්න, ප්‍රියන්ත සිරිකුමාර, නයෝමි තක්ෂිලා, කළණ ගුණසේකර, ගීතිකා රාජපක්ෂ, අමිත්ත වීරසිංහ, ධනූ ඉන්නසිතම්බි ඇතුළු රංගන ශිල්පීන් රැසක් රංගනයෙන් සිය දායකත්වය දක්වා ඇත.

කැමරා අධ්‍යක්ෂණය, සංස්කරණය සහ වර්ණ සංයෝජනයෙන් ප්‍රවීන් ජයරත්න, සංගීත අධ්‍යක්ෂණයෙන් සහ ගීත ගායනයෙන් සංඛ දිනෙත් දායකවී ඇති 'කාමර අංක 106', ප්‍රබෝදිත් ජයකොඩි, ඉමාෂා සේනාධීර, රාජිකා ජීවන්ති, සංඛ දිනෙත්, ප්‍රවීන් ජයරත්න, මිලාන් සුරේෂ් සහ ඒ.ඒ.වී. පුෂ්පරාණි යන කණ්ඩායම එක්ව නිෂ්පාදනය කර ඇත.

# ටෙලි දකිද්දී මටත් ආසයි...

# මගේ මුළු ලෝකයම දැන් දුවයි පුතයි

පුංචි තිරය හරහා ප්‍රේක්ෂක සිත් සොරාගත් ඇය, කාලෙකින් නිර්මාණයකින් දැකගන්න ලැබුණේ නැහැ. හැබැයි ඇයට තියෙන ප්‍රේක්ෂක ආදරයේ නම් කිසිම අඩුවක් වෙලා නැහැ. රංගන ජීවිතයට තාවකාලික විරාමයක් තබමින්, දුවෙකුට සහ පුතෙකුට ආදරණීය මවක් වී සැබෑ ජීවිතයේ භූමිකාව හැඩකරන රුවන්ගි රත්නායක, ඇගේ අලුත්ම තොරතුරු සමඟින් 'හාට්' පිටු අතරට එක්වන්නේ මෙලෙසිනි.



> මම කලාවට පුදුම ආදරයක් තියෙන්නේ. මගේ සැමියාගෙන් වුණත් කිසිම බාධාවක් නැහැ.



රුවන්ගි රත්නායක

**ඉතින් කොහොමද රුවන්ගි?**

හොඳින් ඉන්නවා. හැබැයි මේ දිනවල මම ටිකක් අසනීප තත්ත්වයෙන් ඉන්නේ.

**කාලෙකින් ඔබගේ රඟපෑමක් අපට දැකගන්න ලැබුණේ නැති තරම්?**

ඇත්තටම ඔව්. මම හිතන්නේ අවුරුදු තුනහමාරකින් විතර නිර්මාණයකට සම්බන්ධ වෙන්න බැරිවුණා.

**එහෙම වෙන්න විශේෂ හේතුවක් තියෙනවද?**

ඔව්. විශේෂ හේතුවක් තියෙනවා. මම දැන් දෙදරු මවක්. මට දුවෙකුයි පුතෙකුයි ඉන්නවා. ඒ දෙන්නම තාම පොඩියි. මගෙත් සැමියාගෙත් ලෝකය දුවයි පුතයි. ඉතින් දරුවන් වෙනුවෙන් අපේ මුළු කාලයම යොදවනවා. මේ වෙලාවේ කලා කටයුතු වෙනුවෙන් කාලය යොදවලා වැඩ කරන්න අමාරුයි. දුවයි පුතයි ටිකක් ලොකු වෙනකම් රංගන කටයුතු සඳහා සම්බන්ධ වෙන්න බැරි වෙයි.

**මේ ගෙවුණු කාලයේදී කලා කටයුතුවලින් ආරාධනා එහෙම ලැබුණද?**

එදා ඉඳලා මට තවමත් ආරාධනාවලින් නම් අඩුවක් නැහැ. මොනවා කරන්ද ඉතින්. ප්‍රතික්ෂේප කරන්න වෙනවා අකැමැත්තෙන් වුණත්.

**රුවන්ගිට හමුවන ආදරණීය ප්‍රේක්ෂකයන් මොන වගේ ප්‍රතිචාරද දක්වන්නේ?**

ඇත්තටම මට තවම ප්‍රේක්ෂකයන්ගේ ආදරය තියෙනවා. ඒ තරමට මම රඟපාපු චරිත ඔවුන්ට මතකයි. අහන්නේ කාලෙකින් රඟපානවා දැක්කේ නැහැ, ආපහු රඟපානවද කියලා. එහෙම අහන වෙලාවට පොඩි දෙන්නත් ළඟ හිටියොත් පෙන්නලා මේ දෙන්නා නිසා දැන්ම රඟපෑම් කටයුතු සඳහා සම්බන්ධ වෙන්න අපහසුයි කියනවා. ළඟ නැතිනම් පොඩි දෙන්නගේ වැඩකටයුතු නිසා කාර්යබහුලයි කියනවා.

> ඇත්තටම මට තවම ප්‍රේක්ෂකයන්ගේ ආදරය තියෙනවා.

**මේ දවස්වල දකින නිර්මාණ එක්ක හිතට පොඩි ආසාවක් එනවා ඇති?**

ටෙලිනාට්‍ය, චිත්‍රපට මට විවේකයක් ලැබුණාම බලනවා. ඒ වෙලාවට නම් හිතට පොඩි ආශාවක් එනවා මේ චරිතය මට කරන්න තිබුණා නම් කියලා.

**පූර්ණකාලීන සමුගැනීමක් වෙයිද?**

අපෝ නැහැ. මම කලාවට පුදුම ආදරයක් තියෙන්නේ. මගේ සැමියාගෙන් වුණත් කිසිම බාධාවක් නැහැ. මගේ රඟපෑම් කටයුතු සඳහා ඔහු ගොඩක් උදව් කරනවා. කලාවෙන් සමුගන්න නම් කිසිම අදහසක් නැහැ. මේ වෙලාවේ මවක් විදියට මම දරුවන් වෙනුවෙන් ළඟ සිටිය යුතුයි. පොඩි අයට තේරෙන වයස ආවට පස්සේ සුපුරුදු පරිදි මම නැවත නිර්මාණ හරහා

**වසන්ත විතාරණගේ**



# තවමත් ආරාධනාවලින් අඩුවක් නැහැ...



මේ දවස්වල ජනප්‍රිය ටෙලි සහ සිනමා නිළි නෙත්මි රොෂෙල් ගැන හැමෝම වගේ කතාබහ කරනවා. ඒ සුවිශේෂ කතාබහට හේතුපාඨ වෙලා තියෙන කාරණා කිහිපයක්ම තියෙනවා. එකක් සෝනු මන්දාරා ටෙලිය වෙත ප්‍රේක්ෂකයන්ගේ හිතේ පැලපදියම් වෙලා තියෙන අසීමිත ආකර්ෂණය. අනෙක් කාරණය රොෂෙල්ගේ අලුත්ම චිත්‍රපට දෙකක් වූ 'කල්පනා' සහ 'එදා රෑ' හෙට අනිද්දාම තිරගත වීමට නියමිතව තිබෙනවා. ඒ වගේම ඒවායේ ට්‍රේලර් මේ දවස්වල සමාජ මාධ්‍යවල එකසිය ගානට වයිරල් වෙනවා. ඉතින් හැමෝම අතර ඒ විදියට හිටිවෙලා ඉන්න මේ සුන්දර නිළි කෙල්ලව 'හාට්' එකේ කතාබහකට එක්කර ගන්නට අප දරපු වෑයමයි මේ සනිටුහන් වෙන්නේ.

> මුළු කෑෘ එකම මේ ජනප්‍රියත්වයට දායකත්වය දෙනවා.

පසුතැවීම්, කලකිරීම් නැති මේ ගමන ඇතුළේ

# නෙත්මි රොෂෙල් හරිම ලකී...






**පවුල තමයි මගේ හැමදේම**

**මේ දවස්වල නම් රොෂෙල් ගොඩක්ම බිසී නේද?**

ඇත්තටම පසුගිය දවස්වල වැඩ ගොඩකට මැදිවෙලා හිටියා. ඊයේ පෙරේදා තමයි මේ විදියටවත් කතාබහකට එන්න පුංචි විවේකයක් ලැබුණේ.

**අපට කියන්නකො ඉතින් ඔය තරමට ගොඩගැහුණු වැඩ මොනවද කියලා?**

සෝනු මන්දාරා ටෙලිඩ්‍රාමා එකේ රූගතකිරීම් එක දිගටම වැටුණා. ඒ අතර මගේ අලුත්ම ෆිල්ම් දෙකක්ම තිරගත වීමට ආසන්න නිසා ඒවායේ ප්‍රවර්ධන කටයුතුවලට සහාය දෙන්න එහාට මෙහාට දුවනවා. තවත් අලුත්ම චිත්‍රපටයක ෂූටින් ඉවර වුණේ ඒ අතරමයි. ආයෙම අලුත්ම ටෙලිඩ්‍රාමා එකක ෂූටින් හෙට අනිද්දම ආරම්භ වීමට නියමිතව තියෙනවා.

**වැඩ ගොඩක් කියන්නේ ඉතින් නිළියකට වාසනාවක් එහෙම නේද රොෂෙල්?**

ඔව්. ඇත්තටම මම හරිම වාසනාවන්තයි කියලා මටත් හිතෙනවා. රංගන කලාවට ඇවිදින් අවුරුදු 7යි. ඒ අවුරුදු 7ට චිත්‍රපට 7කට රඟපාලත් අහවරයි. ටෙලි සිනමාවට එන හැම නිළියකගෙම හීනය වෙන්නේ සිනමාවට පිවිසෙන එකයි. මම එහෙමට ඒ ගැන හීන දැක්කේ නැහැ. හැබැයි ටෙලි තිරයට ඇවිදින් අවුරුද්දක් යන්නත් කලින් මට චිත්‍රපට දෙකකටම ඇග්‍රිමන්ට් සයින් කළා.

**'ආදරණීය ප්‍රාර්ථනා' චිත්‍රපටයේ ඔබ රඟපෑ චරිතය හොඳම නිළිය සඳහා නොමිනේට් වුණා?**

ඔව්නේ. ඒක මට හිතාගන්නවත් බැරිවුණා. ඒ වගේම නොමිනේට් වෙනවා කියන්නෙත් ඉතින් සම්මානයක් ලැබුණා හා සමානයි කියන එක තමයි.

**'සෝනු මන්දාරා' නිසා පාරේ බැහැලා යන්නත් බැරි තරමට රොෂෙල් මන්දාරාගේ කැරැක්ටර් එක හිට් වෙලාලු නේද?**

හිතාගන්නත් බැරි තරමටයි ප්‍රතිචාර එන්නේ. අපේ ප්‍රේක්ෂකයෝ අපට ඒ තරමට ආදරෙයිද කියලා වෙලාවකට පුදුමත් හිතෙනවා.

**'සෝනු මන්දාරා' ඒ තරමට ජනප්‍රිය වෙන්න හේතු වුණේ මන්දාරාගේ සංවේදී රංගනයද?**

එහෙම කියන්න බැහැ. 'සෝනු මන්දාරා' ටෙලියේ මුළු කෘෘ එකම මේ ජනප්‍රියත්වයට දායකත්වය දෙනවා. මම දර්ශන් අයියා ඇතුළු රංගන ශිල්පීන්, තිරරචනය, අධ්‍යක්ෂණය ඒ හැම දේම මේ ජනප්‍රියත්වයට උරදුන්නා. එතකොට නුවරඑළිය පැත්තේ ලස්සන ලොකේෂන්ස්, අනෙක මේක පවුලේ හැමෝටම එකට වාඩිවෙලා බලන්න පුළුවන් විදියේ කතාවක් නිසාත් සෝනු මන්දාරා හැමෝම අතරට ගියා. විශේෂයෙන් අපේ කණ්ඩායමේ එකමුතුකමත් මේ සාර්ථකත්වයට තවත් හේතුවක් වුණා.

**ඔබ තිරපිටපත් භාරගන්නේ යම් සීමාවක් ඇතුවලු?**

අනිවාර්යයෙන් ඒක මගේ ප්‍රතිපත්තියක්. නිර්මාණයකට ඇතුළත් වෙන දර්ශන, ඇඳුම් පැලඳුම් ගැන වගේම කතාව ගැන පවා හිතලයි මම තීරණ ගන්නේ.

**ඒක ඔබේ පියා විසින් දැමූ නීතියක්ද රොෂෙල්?**

නීතියක් නෙවෙයි. යම් නිර්මාණයකට ආරාධනා ලැබුණාම මම මගේ පවුලේ අය එක්ක කතාබහ කරනවා. අදහස් ගන්නවා.

**තාත්තා කැමැති වුණේ නැහැ ඔබ නිළියක් වෙනවට. සහාය දුන්නේ අම්මා විතරයි නේද?**

අම්මාගේ ලොකුම හීනයක් වුණේ මම නිළියක් වෙනවා බලන්නයි. පුංචි කෙල්ලක කාලේ ටීවී එකේ ටෙලිඩ්‍රාමා බලනකොට අම්මගේ හීනෙත් එක්ක මගේ හිත කොනකත් පුංචියට වගේ ඒ ආශාව තිබුණා. හැබැයි මම ඒ ආශාව හිත කොනක තියාගෙන මගේ අධ්‍යාපන කටයුතු හමාර කළා.

**ඉන් පස්සේ ඔබ ජාතික රූපවාහිනියේ අවුරුදු කුමාරි තරගෙට යනවා?**

ඔව්. ඒක මගේ හිතේ තිබුණු ලොකුම හීනයක් වගේම ආශාවක් වුණා.

**තාත්තා එතැනදිත් කැමැත්ත දුන්නේ නැහැ?**

අමාරුවෙන් මම කැමැත්ත ගත්තා කියන්නකෝ. හැබැයි තාත්තා කොන්දේසියක් දානවා රඟපාන්න යන්න බැහැ කියලා. ඔන්න ජාතික රූපවාහිනියේ 2019 අවුරුදු කුමාරි විදියට මම කිරුළ දරනවා. ඉන් පස්සේ මගේ පළමුවැනි ටීවී ප්‍රෝග්‍රෑම් එක විදියට නුගසෙවණට සහභාගි වෙනවා. එතැනදී පළමු ටෙලියට ආරාධනා ලැබෙනවා අරුණ ජයවර්ධන සහ අංජලී බුදවත්ත යන ප්‍රවීණයන්ගෙන්.

**තාත්තාගේ කැමැත්ත ගන්න ලොකු සටනක් කරන්න වෙනවා?**

සටන ජයගත්තේ අරුණ ජයවර්ධන අයියයි අංජලී අක්කයි මැදිහත් වෙලා කරුණු කාරණා වටහා දීලා තාත්තාගේ හිත හදපු නිසයි. 'සක්කාරං' ටෙලිඩ්‍රාමා එක නිර්මාණය වුණේ අන්න ඒ විදියටයි. මමත් එම අලංකාර නිර්මාණය තුළ හාහාපුරා කියලා රංගනයට පියවර තිබ්බා.

**නොසිතූ ලෙස දිගින් දිගටම එතැන් පටන් ආරාධනා ආවා...?**

තෝරාගැනීම් කළේ ඉතා සීමාසහිතවයි. දොඩම් ගොඩ එකපාරම බදාගන්නා කලාවට මම මනාප නොවන නිසා හොඳ නිර්මාණ, මට ගැළපෙන නිර්මාණ ප්‍රේක්ෂකයන් වෙනුවෙන් මතක හිටින යමක් කරන්න පුළුවන් සහ සාධාරණ යමක් කරන්න පුළුවන් චරිත පමණක් භාරගන්න මම පරිස්සම් වුණා.

**ඒ පරිස්සම මත ඔබ ඉතා අගනා ප්‍රතිරූපයක් ගොඩනගා ගත්තා?**

අහිංසක ආඩම්බර හැඟීමක් හිතට දැනෙනවා මම අද ඉන්න තැන ගැන. ඒ තැන මට හිමිවුණේ අහඹු වාසනාවක් ලෙසයි.

**තාත්තාගේ ප්‍රතිචාරය කොහොමද අද දූ ඉන්න ඒ වාසනාවන්ත අහම්බය ගැන?**

තාත්තා මාව හොඳින්ම දන්නවා. මගේ සීමාව කොතැනද, මොකක්ද කියන කාරණය මම හොඳින්ම වටහාගෙනයි මේ ගමන යන්නේ. ඒ නිසා පවුලේ හැමෝගෙම ආදරය සහාය මට ලැබෙනවා. මගේ පවුල කියන්නේ මගේ ජීවිතේ වැදගත්ම කොටසක්. ඔවුන් තමයි මගේ හැම දේම.

**අද ඉන්න තැන ගැන ඔබ බොහොම තෘප්තිමත්?**

අනිවාර්යයෙන්ම. පසුතැවීම් වැරැදීම් කලකිරීම් නැති ඒ ගමන් මග දිහා ආපහු හැරිලා බලනකොට දැනෙන සතුට අප්‍රමාණයි. නෙත්මි රොෂෙල් හරිම ලකී. එච්චරයි.

**හීන නොදැකපු සිනමාව අවුරුදු 7කින් මාව චිත්‍රපට 7ක හිමිකාරියක් කළා...**



**මගේ සීමාව කොතැනද කියන කාරණය හොඳින්ම වටහාගෙනයි මේ ගමන යන්නේ.**

මල්මි කෞෂල්‍යා

# රටටම කියලා අපිත් එක්ක දීගයක් කන්න එන්න...

බුද්ධික පින්නාදූව

**රටේ ජනප්‍රිය කලාකරුවන් කිහිප දෙනෙකු එකතු වී දීගයක් කන්න යන බවට ලැබුණු ආරංචියත් සමග, 'මව්රට' අපි මේ කතාවේ ඇත්ත නැත්ත හොයාගන්න සම්බන්ධ කරගත්තේ කලා ලොව බහු කුසලතාවලින් පිරිපුන් චරිතයක්. ඒ, දක්ෂ හඬකැවීම් ශිල්පියෙකු, රංගන ශිල්පියෙකු, වාදකයෙකු, අධ්‍යක්ෂවරයෙකු, තිර පිටපත් රචකයෙකු මෙන්ම ගුරු වෘත්තියේද නිරත වන බුද්ධික පින්නදූවයි.**

**බුද්ධික, රටටම ආරාධනා කරලා දීගයක් කන්න යනවා කියන්නේ ඇත්තක්ද?**

මේ දවස්වල සමාජ ජාලවල වැඩිපුරම කතාබහට ලක්වන දෙයක් තමයි ආටිස්ට්ලා කීප දෙනෙක් එකතු වෙලා දීගයක් කන්න යනවා කියන කතාව. මමත් එදාට දීගයක් කන්න යනවා. ජනප්‍රිය රංගන ශිල්පී, නාට්‍යවේදී මංජුල කෝනාරගේ 'දීගේ කයි' වේදිකා නාට්‍යය ජුනි 07 ඉරිදා මරදාන ටවර් රඟහලේදී වේදිකාගත කිරීමට සියලු කටයුතු සූදානම්. ඉවෙන්ට්වර් ආයතනය තමයි සංවිධාන කරන්නේ. අසංග පෙරේරා, උදය කුමාරි, ඉමේෂාන් නෙල්ලිගහවත්ත, ධනංජී තාරුකා, නිලන්ති ගුණවර්ධන, මංජුල කෝනාර, රත්නායක බණ්ඩාර සහ මමත් ඊට රංගනයෙන් දායක වෙනවා. මංගල දර්ශනය ගල්ග මුව පැත්තේ තමයි තිබ්බේ. දුර පළාත්වල පෙන්වලා කොළඹ ප්‍රදර්ශනය කරන ප්‍රථම අවස්ථාව තමයි මේක. හැමෝම අහලා තිබුණා කොළඹට කවද්ද එන්නේ කියලා. පටන්ගැන්මේ සිට මිනිස්සුන් අතරට ගියා. ජනගී ආශ්‍රයෙන් සැදුණු පටන් ගැන්මෙ සිට අවසානය දක්වාම ඇති වෙනකන් හිනා වෙන්න ආරච්චි පවුලක් වටා සම්බන්ධ වන කතාවක්. සිනා සාගරගේ කිමිදෙන්න කැමැති අය එන්න එදාට රඟපාන හැමෝම නාට්‍ය ඇතුළේ දීගේ කෑමක් තමයි තියෙන්නේ.

**තේමාව ගැන මතක් කළොත්?**

'හිතන දේ වෙන්නේ නැහැ - වෙන දේ හිතා ගන්න බැහැ' කියන එකයි තේමාව. ඇත්තටම නරඹන කෙනෙක්ට නාට්‍යයේ ඊළඟ තත්පරේ මොකක්ද වෙන්නේ කියලා හිතාගන්න බැහැ. ඒ නිසා තමයි මංජුල කෝනාර නාට්‍යවේදියා මේ තේමාව යොදාගෙන තියෙන්නේ.

**එතකොට මොකක්ද මේ බුද්ධික සමාජ ජාල පුරාවට පතුරවා හරින 'අඳුර'?**

පින්න ප්‍රඩක්ෂන් හැමදාම වගේ මෙදා සැරෙත් සම්ප්‍රදාය අතික්‍රමණය කරපු වැඩක් කළා 'අඳුර' කියලා. බොහෝ දෙනෙක් මේ වැඩේ ගැන අහලා තිබුණා. එක එක විදිහට වැඩේ දිහා බලලා තිබුණා. ෆිල්ම් එකක් වගේ බැලූ බැල්මට පෙනුණත් මේක මියුසික් වීඩියෝවක්. ෆිල්මින් කලර් ටෝන් යොදාගෙන තාක්ෂණය උපරිම භාවිත කරලා තමයි මේක කළේ. ලක්මාල් ලබුනාහේවගේ විසින් රචනා කරපු මෙය ගායනා කළේ ඉසුරි. මියුසික් වීඩියෝ එකේ කතාව, තිරපිටපත හා අධ්‍යක්ෂණය මම කළේ. ඉදිරි සතියේදි බොහෝදුරට මෙය බැලිය හැකි වෙයි.

**ඔබේ කලා ගමනේ ආරම්භය ගැනත් මතක් කරමු?**

මම කැලණිය ශ්‍රී ධර්මාලෝක විද්‍යාලයෙන් උ/ පෙළ හැදෑරීම් කරද්දී ඒ අංශයෙන් කරපු නාට්‍යයක මම කාන්තා චරිතයක් කළා. තවත් නාට්‍යයක් ඉන් පසු කළා. එයින් පසුව විල්සන් ගුණරත්න සර්ගේ 'චරිත අටක්' වේදිකා නාට්‍යයට හා 'සුද්දගේ කියුම' චරිත රැසක් නාට්‍ය කළා. ජනප්‍රිය ජයසිංහ මහතාගේ 'සූටි බූටි පූසා', මාතර නාද් සහෝදරයාගේ 'අකාලික' නාට්‍යයට සම්බන්ධ වුණා. වේදිකාවට පය තියන්න පිනක් තියෙන්න ඕනෙ. මමත් මුලින්ම ආවේ වේදිකාවෙන්.

**ඉගෙනගෙන ආවොත් නේද පැවැත්මක් තියෙන්නේ?**

ඔව්. කලාව කියන්නේ ගැඹුරු විෂයක්. ඉගෙනීමක් නැතුව පැවැත්මක් නැහැ. ප්‍රවීණ රංගධර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විල්සන් ගුණරත්න සර් යටතේ මම අවුරුදු හතරක් රංගනය ගැන න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ඉගෙන ගත්තා. එයින් මම මට ආවේණික වූ සිස්ටම් එකක් හදාගත්තා.

**ඔබේ පියා සටන් කලාවේ ප්‍රවීණයෙක්. ඇයි ඔබ ඔහුගේ කලාව ඉදිරියට රැගෙන නොයන්නේ?**

ඇත්තටම මට ඒ පැත්තෙන් යන්න අදහසක් නැහැ. මම තෝරාගත්තේ වෙනම පැත්තක් නිසා ඒ ගැන හිතන්න වෙලාවක් හම්බවුණේ නැහැ.

**කලාව ගැන ඔබේ අදහස?**

මම දකින විදිහට කලාව කියන්නේ හිත් රිදුණු බිඳුණු අය සනසවාලන එකයි. කලාකරුවන් කියන්නේ ලයිසන් නැති වෛද්‍යවරු. කලාවට පුළුවන් ඕනෙ කෙනෙක්ගේ සිත සුවපත් කරවන්න.

**බුද්ධික ඔබ විවාහකද?**

නැහැ තවම පෙම්වතියක් නැහැ. ඒ ගැන තවම හිතලා නැහැ. හිතන්න කාලේ නම් හරි අඩුයි. ඒ වුණත් මට හරියන කෙනෙක් ලැබෙනකන් ඉන්නවා.

**ඉදිරි බලාපොරොත්තු?**

මගෙන් කලාව හැදෑරීම් කරපු අයව ක්ෂේත්‍රයේ ඉහළම තැනකට ගෙන එන එක මගේ ලොකුම බලාපොරොත්තුව. ඒ වගේම සෑම වර්ෂයක් පාසා කරන 'පින්න ලෙගසි' සම්මාන උළෙල තව තවත් උපරිම කිරීමට බලාපොරොත්තු වෙනවා. 'අන්තිම තුරුම්පුව' වේදිකා නාට්‍යය ළඟදීම වේදිකාගත කරන්න සූදානම් කරගෙන යනවා.

**ස්ටෙෆනි කොතලාවල**





දුර පළාත්වල පෙන්වලා කොළඹ ප්‍රදර්ශනය කරන ප්‍රථම අවස්ථාව තමයි මේක.

කලාව කියන්නේ හිත් රිදුණු බිඳුණු අය සනසවන තැනක්...

හිතන දේ වෙන්නේ නැහැ වෙන දේ හිතාගන්න බැහැ...

කලාකරුවෝ කියන්නේ ලයිසන් නැති වෛද්‍යවරු...

තවම පෙම්වතියක් නැහැ. ඒ ගැන තවම හිතලා නැහැ.

# කෝන්දරේ

ගලපන ගැලපෙන තැන...




## ඉලක්කම් අස්සේ හැංගුණු දෛවයේ රහස

# පොකට් එකේ තියෙන්නේ කෝටිපති යෝගයක්ද? ණය කන්දකට පාර කපන වින්නැහියක්ද?

උදෑසන අවදි වූ මොහොතේ සිට රාත්‍රී නින්දට යනතුරුම අපේ අතින් අත හැරෙන්නේ නැති, අපේ ජීවිතයේ සමීපතම සෙවණැල්ල බවට පත්ව ඇති මෙවලම කුමක්දැයි ඇසුවහොත් ඕනෑම අයෙකු දෙන එකම පිළිතුර ජංගම දුරකතනයයි. නමුත්, දවසේ පැය විසිහතර පුරාම අපේ ශරීරයට සහ සිතුවිලිවලට ළංවී පවතින මේ දුරකතන අංකය පිටුපස, ඔබේ දියුණුව හෝ පිරිහීම රහසින් තීරණය කරන අද්භූත සංඛ්‍යාත්මක ශක්තියක් සැඟවී ඇතැයි ඔබ කවදා හෝ සිතුවාද? ඇතැම් අයට අලුත් දුරකතන අංකයක් ගත් පසු හිටිහැටියේම ව්‍යාපාර දියුණු වී ධන උල්පත් පෑදෙද්දී, තවත් සමහරෙකුට තිබූ රැකියාව පවා අහිමි වී ණය බරින් මිරිකෙන්නට සිදුවන්නේ නිකම්ම නොවේ. පුරාණ සංඛ්‍යා විද්‍යාවට අනුව, විශ්වයේ පවතින සෑම ඉලක්කමකටම ආවේණික වූ බලවත් ශක්ති කිරණක් පවතින අතර, දුරකතන අංකයකින් නිරන්තරයෙන් නිකුත් වන තරංග අපේ දෛවය වෙනස් කිරීමට සමත් වෙයි.

මේ විශ්වීය රහස ඔබේ දුරකතන අංකයටත් බලපාන හැටි වටහා ගැනීම ඉතා සරල කටයුත්තකි. ඒ සඳහා කළ යුත්තේ ඔබේ ජංගම දුරකතන අංකයේ ඇති (07x බිංදුව හැර ඉතිරි ඉලක්කම් නවය) සියලු අංක එකිනෙකට එකතු කර, එය තනි ඉලක්කමක්  වන තෙක් සුළු කිරීමයි. උදාහරණයක් ලෙස ඔබේ අංකයේ ඉතිරි ඉලක්කම් එකතු කළ විට 43ක් ලැබුණේ නම්, එම 43 නැවත 4 සහ 3 ලෙස එකතු කළ යුතුය. එවිට ලැබෙන අවසාන අංකය 7යි. දැන් ඔබට ලැබුණු ඒ තනි ඉලක්කම ඔබේ ජීවිතයට රහසින් කරන බලපෑම කුමක්දැයි අප විමසා බැලිය යුතුය.

ඔබේ අංකයේ අවසාන එකතුව ලෙස අංක එක ලැබුණේ නම්, එය රවි ග්‍රහයාගේ බලය පෙන්වන අතිශය වාසනාවන්ත පිහිටීමකි. ව්‍යාපාරිකයන්ට, දේශපාලනඥයන්ට සහ ආයතන ප්‍රධානීන්ට මේ අංකය කදිම වන අතර, එමඟින් සමාජයේ කැපී පෙනීම, නායකත්වය සහ කීර්තිය නිතැතින්ම ළඟා කර දෙයි. යමෙකුට ලැබෙන්නේ අංක දෙක නම්, එය සඳු සහ සිකුරුගේ සංකලනයක් බඳු සංවේදී අංකයකි. කලාකරුවන්ට, ලේඛකයන්ට මෙන්ම උපදේශන ක්ෂේත්‍රයේ අයට මේ අංකය තුළින් අන් අයගේ සිත් දිනාගැනීමේ අපූර්ව ආකර්ෂණයක් හිමි වුවද, දැඩි ව්‍යාපාරික කටයුතුවලට මෙයින් ලැබෙන දායකත්වය මඳක් අඩුය. ගුරු ග්‍රහයාට හිමි අංක තුන ලැබෙන අංක, ගුරුවරුන්, නීතිඥයන් සහ මූල්‍ය උපදේශකයන්ට අතිශයින්ම සුබ වන අතර, එය සමාජයෙන් ගරුබුහුමන් ලැබීමටත්, නීතිමය ප්‍රශ්නවලින් මිදීමටත් මඟ පාදයි.

කෙසේ වෙතත්, එකතුව අංක හතර ලැබෙන දුරකතන අංක භාවිතයේදී මඳක් ප්‍රවේශම් විය යුතුය. රාහුට හිමි මෙම අංකය නිසා ජීවිතයට හදිසි කඩා වැටීම් හෝ අනපේක්ෂිත කරදර පැමිණිය හැකි වුවත්, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අයට සහ මාධ්‍යවේදීන්ට සුවිශේෂ ජයග්‍රහණ ගෙන දීමටද මෙය සමත් වෙයි. සියලු ආකාරයේ ව්‍යාපාරිකයන්ට සහ වෙළෙඳාමේ යෙදෙන අයට ලැබිය හැකි හොඳම අංකය වන්නේ බුධට හිමි අංක පහයි. සන්නිවේදනය බලවත් කරන මෙම අංකය පාරිභෝගිකයන් ආකර්ෂණය කරගැනීමටත්, ගනුදෙනු සාර්ථක කරගැනීමටත් මහඟු පිටුවහලක් වෙයි. විලාසිතා, රූපලාවණ්‍ය, සිනමාව හෝ හෝටල් ක්ෂේත්‍රයේ නියුතු අයෙකුගේ අංකයේ එකතුව සිකුරුට හිමි අංක හය වූවා නම්, එය රත්තරන් වැනි පිහිටීමකි. එමඟින් මිල මුදල් වාසනාව මෙන්ම ප්‍රතිවිරුද්ධ ලිංගිකයන්ගේ ආකර්ෂණය නිරන්තරයෙන්ම ළඟා කර දෙයි.

කේතු ග්‍රහයාට හිමි අංක හත අවසානයට ලැබෙන අංක ලෞකික හෝ මුදල් සෙවීමේ කටයුතුවලට එතරම් සුබ නැතත්, ජ්‍යොතිෂවේදීන්ට, පර්යේෂකයන්ට සහ දාර්ශනිකයන්ට තම ඥානය වර්ධනය කරගැනීමට කදිම උත්තේජනයක් සපයයි. සෙනසුරුට හිමි අංක අට ලැබෙන අංක භාවිත කරන විට ජීවිතයට දැඩි කාර්යබහුලත්වයක්, වෙහෙසක් මෙන්ම කරන හැම දේම ප්‍රමාද වීමේ ස්වභාවයක් ඇති විය හැකි වුවද, දේපළ වෙළෙඳාම් සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අයට දීර්ඝකාලීන ස්ථාවරත්වයක් ලබාදීමට එය සමත් වෙයි. අවසාන වශයෙන්, කුජගේ බලය ලබන අංක නවය ආරක්ෂක අංශ, ක්‍රීඩකයන්, වෛද්‍යවරුන් සහ ඉංජිනේරුවරුන්ට ඉතා සුබ වන අතර, ඕනෑම අභියෝගයකට මුහුණ දීමේ ධෛර්යය සහ තරඟකාරීත්වයෙන් ජයග්‍රහණය කිරීමේ වාසනාව එමඟින් උදා කර දෙයි.

දුරකතන අංකයක අවසාන එකතුව කුමක් වුවත්, සංඛ්‍යා විද්‍යාවේ එන තවත් රහසක් කෙරෙහිද අප අවධානය යොමු කළ යුතුය. ඔබේ අංකය ඇතුළත අටේ ඉලක්කම් දෙකක් එක ළඟ පිහිටීම හෝ හතර සහ අට යන ඉලක්කම් එක ළඟ පිහිටීම නිතරම අනපේක්ෂිත ණය බර සහ නඩු හබවලට පැටලීමට හේතු වන බව කියැවෙයි. එම නිසා, නිකම්ම ලස්සන අංකයක් හෝ මතක තබා ගැනීමට ලේසි අංකයක් තෝරාගන්නවා වෙනුවට, තමන්ගේ ලග්නයට සහ රැකියාවට ගැළපෙන විශ්වීය ශක්තියක් ඇති දුරකතන අංකයක් තෝරාගැනීමට වගබලා ගැනීම ඔබේ අනාගත දියුණුවේ රහස් දොරටුව වනු ඇත.

ජ්‍යොතිෂවේදී
ඔස්මන් පෙරේරා



# සල්ලි එන පාරවල් එකින් පිට එක වැහෙන ඊශාන දිග

## මෙන්න කඩන්නේ නැතුව ගොඩයන විදිය

**"කොපමණ හරිහම්බ කළත් සතයක්වත් ඉතිරි වෙන්නේ නැහැ", "ගෙදරට සල්ලි ලැබෙන මාර්ග එක පාරටම වැහිලා යනවා" - වර්තමානයේ බොහෝ දෙනෙක් පවසන මේ පොදු මැසිවිලිවලට හේතුව කේන්දරයේ අපලයක්ම නොව, තමන් ජීවත් වන නිවසේ ඔබ නොදැනුවත්වම සිදුවී ඇති බරපතළ වාස්තු දෝෂයක් විය හැකියි. වාස්තු විද්‍යාවට අනුව නිවසක දියුණුව, ධනය සහ සැනසීම තීරණය කරන ප්‍රධානතම ස්ථානය වන්නේ ඊසාන දිශාවයි. විශ්ව ශක්තිය නිවසකට ඇතුළු වන ප්‍රධාන ද්වාරය වන බැවින්, පුරාණ ඍෂිවරුන් ඊසාන දිශාව හැඳින්වූයේ "දේව මූල්‍ය කලාපය" ලෙසයි. මේ කියන සුවිශේෂී කලාපයේ සිදුවන සුළු හෝ වාස්තු දෝෂයක් මුළු පවුලේම සේසතම පාළු කිරීමට සමත් වෙයි.**

බොහෝ නිවෙස්වල ඉඩකඩ කළමනාකරණය කිරීමට ගොස් ඊසාන දිශාව සම්පූර්ණයෙන්ම අවුල් කරගන්නා අවස්ථා එමටය. මේ සුවිශේෂී දිශාවට වැසිකිළියක් හෝ කැසිකිළියක් හසුවීම බරපතළම වාස්තු දෝෂය වන අතර, එමඟින් නිවසට ඇතුළු වන පිරිසිදු විශ්ව ශක්තිය දූෂණය වී, දැඩි ධන හානිය මෙන්ම නිවැසියන්ට සුව නොවන හිසේ රෝග සහ ස්නායු ආබාධ ඇති කරයි. එමෙන්ම ඊසාන යනු ජලයට අධිපති දිශාව බැවින්, එහි කුස්සිය පිහිටුවා ළිප තැබීමෙන් ජලය සහ ගින්දර අතර ගැටුමක් ඇති වී නිවසේ දියුණුව සම්පූර්ණයෙන්ම අඩාළ වෙයි. මීට අමතරව, භාවිතයෙන් ඉවත් කළ පරණ බඩුබාහිරාදිය, යකඩ, දර හෝ කුණු බාල්දි ඊසාන දිශාවේ ගොඩගසා තැබීමෙන් එම දිශාවෙන් එන සුබ ශක්තීන් සියල්ල අවහිර වී යයි.

ඔබේ නිවසේත් ඊසාන දිශාවේ මෙවැනි දෝෂ තිබේ නම්, නිවස කඩා බිඳ දමන්නේ නැතිව කරගත හැකි සරල ගුප්ත සහ වාස්තු පිළියම් කිහිපයක් පවතී. පළමුවෙන්ම කළ යුත්තේ ඊසාන දිශාව හැකිතාක් සැහැල්ලුවෙන් සහ පිරිසිදුව තබාගැනීමයි. එම ප්‍රදේශයේ බිත්තිවලට ළා නිල්, සුදු හෝ ළා කොළ පැහැති වර්ණ ආලේප කිරීමෙන් සුබ ශක්තීන් වර්ධනය කරගත හැකියි. එමෙන්ම, ඊසාන දිශාවෙන් නිවස ඇතුළත හෝ මිදුලේ කුඩා පැන් බඳුනක්, වතුර වීදුරුවක් හෝ කුඩා දිය උල්පතක් තැබීමෙන් ධන ආකර්ෂණය වේගවත් වන අතර, හැදෙන සේර පැළයක් හෝ මනි ප්ලාන්ට් පැළයක් මෙහි තැබීමද ඉතා සුබයි. වඩාත්ම සාර්ථක පිළියමක් වන්නේ, ඊසාන දිශාවේ ඇති කාමරයක හෝ මුල්ලක කුඩා වීදුරු පිඟානකට පිරිසිදු ලුණු කැට ස්වල්පයක් දමා තැබීමයි. එයින් නිවසේ ඇති නිශේධනීය ශක්තීන් උරාග න්නා අතර, සතියකට වරක් එම ලුණු කුඩු වැසිකිළියට දමා සෝදා හැර අලුත් ලුණු දැමිය යුතුය. නිවසක ඊසාන දිශාව පිරිසිදුව සහ සක්‍රියව තබාගැනීම යනු නිවසට ධන ලක්ෂ්මිය කැඳවා ගැනීමක් බැවින්, අදම ඔබේ නිවසේ ඊසාන දිශාව දෙස බලා එහි ඇති දෝෂ ඉවත් කරගැනීමට පියවර ගන්න.

**ජ්‍යොතිෂවේදී ඔස්මන් පෙරේරා**





# ග්‍රහ මණ්ඩලයේ සතියේ තීන්දුව

## ජුනි 14-ජුනි 20

### මේෂ - කරදර මැද ජය

වැඩ අධික වීම නිසා දැඩි වෙහෙසක් දැනෙන සතියකි. රැකියාවේ වගකීම් වැඩි වන අතර ප්‍රධානීන්ගේ ඇස ඔබ වෙත යොමු වේ. මුදල් ලැබීම් අතින් වාසි සහගත වුවත්, නොසිතූ හදිසි වියදම් මතු වන නිසා අතමිට පාලනය කරගත යුතුය. කේන්ති යාම පාලනය කර නොගතහොත් පවුලේ සමීපතමයන් අමනාප කරගැනීමට ඉඩ ඇත.

### වෘෂභ - අතමිට සරු වෙයි

ආර්ථික අතින් ඉතාම වාසනාවන්ත සතියකි. කලක් තිස්සේ ඇනහිට තිබූ මුදල් කිහිපයක් සහ බලාපොරොත්තු නොවූ ලාභ කිහිපයක් අතට ලැබීමට ඉඩ ඇත. පවුලේ අය සමඟ සතුටින් ගමන් බිමන් යෑමට සහ රසවත් ආහාර වේල් භුක්ති විඳීමට අවස්ථාව සැලසේ. සෞඛ්‍ය පැත්තෙන් දණහිස් හෝ කොන්දේ අමාරු මතු විය හැකි නිසා බර වැඩ කිරීමෙන් වළකින්න.

### මිථුන - වචනයෙන් වාසි

වචනයෙන් වැඩ ගන්නා අයට, ලේඛකයන්ට, මාධ්‍යවේදීන්ට සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ නියුතු අයට සුබ සතියකි. අලුත් ආදායම් මාර්ග කිහිපයක් පැදීමට ඉඩ ඇත. ප්‍රේම සබඳතාවලට මඳක් බාධා හෝ අනවශ්‍ය සැකකිරීම් මතු විය හැක. රථවාහන හැසිරවීමේදී සහ රාත්‍රී ගමන් බිමන්වලදී වෙනදාට වඩා ප්‍රවේශම් වීම අත්‍යවශ්‍ය වේ.

### කටක - වියදම් බහුලයි

සිතේ නොසන්සුන් බවක් සහ නිකම්ම ඇති වන බියක් නිසා පසුතැවිලි වීමට ඉඩ ඇත. අනවශ්‍ය ගමන් බිමන් සහ නිෂ්ඵල වියදම් අධික වන සතියකි. රැකියා ස්ථානයේදී උෂ්ණාධිකව කටයුතු නොකර ඉවසීමෙන් වැඩ කළ යුතුය. සතිය මැද්දී දුරස්ත ඥාතියකුගෙන් හෝ මිතුරකුගෙන් නොසිතූ මොහොතක උදව්වක් ලැබීමට ඉඩ ඇත.

### සිංහ - ප්‍රශංසා සහ පිළිගැනීම

සමාජයේ කැපී පෙනෙන සහ අන් අයගේ ගරුබුහුමන් ලබන සතියකි. ව්‍යාපාරවලින් බලාපොරොත්තු වූවාට වඩා වැඩි ලාභ ලැබිය හැක. රැකියා ස්ථානයේ ප්‍රධානීන්ගේ පැසසුම් හිමි වන අතර අලුත් තනතුරු ලැබීමේ වාතාවරණය සකස් වේ. පවුලේ අනාගත දියුණුව වෙනුවෙන් තීන්දු තීරණ ගැනීමට අතිශයින්ම සුබ කාලයකි.

### කන්‍යා - රැකියා දියුණුව

වෘත්තීය මට්ටමෙන් ඉතාම සුබ සහ සහනදායී සතියකි. නව රැකියා බලාපොරොත්තු වන අයට සුබ ආරංචි ලැබේ. නිවස අලංකාර කිරීමට හෝ අලුත් බඩුබාහිරාදිය මිලදී ගැනීමට මුදල් වැය වේ. කලක සිට පැවති ලෙඩ රෝගවලින් සුවය ලැබෙන මුත්, සෙම් කෝප වීම් සහ පීනස් අමාරු ගැන මඳක් සැලකිලිමත් විය යුතුය.

### තුලා - වාසනාව පෑදේ

උසස් අධ්‍යාපන කටයුතුවල නිරත අයට සහ විදේශ ගමන් බලාපොරොත්තු වන අයට තිබූ බාධා ඉවත් වන සතියකි. සිතේ ආගමික නැඹුරුවක් සහ දානමාන පින්කම්වලට සම්බන්ධ වීමේ අවස්ථා යෙදේ. පිය පාර්ශ්වයෙන් හෝ පවුලේ වැඩිහිටියෙකුගෙන් දේපළක් හෝ මුදල්මය උදව්වක් බලාපොරොත්තු විය හැක.

### වෘශ්චික - තීරණ ගනිද්දී පරිස්සමින්

හදිසි කෝපය නිසා තීරණ ගැනීමෙන් වළකින්න. මුදල් ආයෝජන සහ ලියකියවිලිවලට අත්සන් තැබීමේදී දෙවරක් සිතිය යුතුය. පවුලේ අය සමඟ සුළු මතභේද ඇති වීමට ඉඩ ඇතත්, ඉවසීමෙන් කටයුතු කළහොත් සති අන්තය වන විට තත්ත්වය යහපත් අතට හැරේ. සෞඛ්‍ය ගැන සැලකිලිමත් වන්න.

### ධනු - සබඳතා අලුත් වෙයි

විවාහ ජීවිතයේ පැවති බාධා ඉවත් වී සාමකාමී පරිසරයක් නිර්මාණය වෙයි. හවුල් ව්‍යාපාර කරන අයට සහ අලුත් ගිවිසුම්වලට එළඹීමට බලාපොරොත්තු වන අයට ඉහළ ප්‍රතිඵල ලැබිය හැක. ප්‍රභූන් සහ අලුත් මිතුරන් හඳුනා ගැනීමට ලැබෙන සතියකි. මුත්‍රාශය හෝ උදරය ආශ්‍රිත රෝග ගැන මඳක් සැලකිලිමත් වන්න.

### මකර - සතුරන් පරාජය වේ

ඔබට විරුද්ධව සිටි සතුරන් පරාජය කර, තම අරමුණු නොසැලී ඉටු කරගත හැකි සතියකි. පැරණි ණය බරින් නිදහස් වීමට අවශ්‍ය මඟ පෑදේ. රැකියා ස්ථානයේ සුළු සුළු කුමන්ත්‍රණ මතු වුවත් ඒවායින් ඔබට හානියක් නොවේ. ඍතු වෙනස්වීම් නිසා ඇති වන උණ, සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝගවලින් ආරක්ෂා වන්න.

### කුම්භ - ඥාන වර්ධනය

ඉගෙන ගන්නා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් වැඩිපුර වෙහෙසීමට සහ මුදල් වැය කිරීමට සිදු වේ. කලාව, මෝස්තර නිරූපණය සහ පර්යේෂණ ක්ෂේත්‍රවල අයට ඉතා සුබයි. නොසිතූ ලොතරැයි වාසනාවන් පවා මතු විය හැක. ආහාර විෂවීම් හෝ බඩේ අමාරු ගැන සැලකිලිමත් වීම වටී.

### මීන - දේපළ වාසනාව

නිවාස, ඉඩකඩම් හෝ යාන වාහන මිලදී ගැනීමට හෝ ඒවායේ අලුත්වැඩියා කටයුතුවලට වාතාවරණය සකස් වේ. මවගේ සෞඛ්‍ය තත්ත්වය වෙනුවෙන් කාලය සහ මුදල් වැය කිරීමට සිදු විය හැක. රැකියාවේ පැවති පීඩනකාරී බව අඩු වී සිතට නිදහස සහ සහනයක් ලැබෙන සතියකි.

**ජ්‍යොතිෂවේදී සම්පත් ආරියසිංහ ඉසිවර අසපුව**